# සමාජය විනිවිද දකින
# බඹර වළල්ල

මට අහම්බයකින් මේ අපූරු ශ්‍රී ලාංකික සිනමා කෘතිය රස විඳීමේ භාග්‍යය උදා විනි

කිසිදා නම අසා නුපුරුදු අධ්‍යක්ෂකවරයකුගේ නම නෙත ගැටුණ ද සුපුරුදු ප්‍රවීණ නළු නිළි නාමාවලිය දැකීමෙන් මා තුළ වූ චකිතයක් පහ වූ බව නම් සත්‍යයකි සිත් නලවන සනසන දඟලන වේග රිද්මය මුසු වූ සංගීත සංකලනය චිත්‍රපට නාමාවලිය පෙළ ගැසෙන මොහොතේ සිට ම ප්‍රබල රිද්මයක් මසිතට දනවන්නට සමත් විය ප්‍රධාන නළුවා අතුල ලියනගේ වීම කවර පුදුමයක් ද?

චිත්‍රපටය අන් කිසිවක් නොව මේ දිනවල ශ්‍රී ලංකාවේ මෙන් ම ඇමරිකාවේත් වගකීමකින් යුතු සියළු ඉංග්‍රීසි සිංහල ජනමාධ්‍ය වලින් අපූරු විවරණ නංවන අතුල ලියනගේ නමැති නවක අධ්‍යක්ෂවරයාගේ කුළුඳුල් නිර්මාණය වන 'බඹර වලල්ල' ය

ගුණාත්මක වර්ණනාත්මක විවරණවලින් අඩු නොවූ 'බඹර වලල්ල' බොහෝ විද්‍යුත් හා ජනමාධ්‍යවල අවධානය ලැබූ බව මිතුරකු අතින් පසුව කියවෙනු ඇසූ මට ඒ පිළිබඳ පුදුම වෙන්නට කරුණක් නැති බව පසක් විය

පසුගිය සතියක 'බුදු සරණ' පුවත්පතේ කතු වැකියෙන් 'බඹර වලල්ල' පිළිබඳ විවේචනයක් කියවූ මා මිතුරකුගේ මහළු මව්පියන් චිත්‍රපටය බලන්නට උනන්දු වූ බව මිතුරා සිහි කළේ සිනා මුසු මුහුණෙනි

අටුවා ටීකා නැති උනත් කෘතිය උත්කෘෂ්ඨ බවට මේ සාධක කවර මනාද?

'බඹර වලල්ල' අතීත වර්ථමාන අනාගත අපේ මිනිසුන්ගේ සැබෑ මිනිස් සිතුම් පැතුම් විනිවිද දකින්නට අධ්‍යක්ෂවරයා විශිෂ්ඨ ලෙස සිනමාත්මක මාධ්‍යය උපයෝගී කර ගත් කදිම අවස්ථාවකි



අතුල ලියනගේ කවර අදහසක් පෙර දැරි කරගෙන නිර්මාණය කළත් කවදා කිනම් අත්දැකීම් සම්භාරයක් කැටි කොට කථාව ලියූවත් ලාංකීය සිනමා ප්‍රේක්ෂකයින් පුදුමයට පත් කර පුටුවල ඇල වුණු ගල් රූ කරන්නට කෘතිය සමත් වූ බව නම් මම දනිමි අල්පෙනෙත්ති තුඩක් වැටුණත් ඇසෙන තරම් නිසොල්මන් වූ ප්‍රේක්ෂකාගාරය විවේක කාලයක් අපේක්ෂා නොකළ බව සියළු දෙනාගේ හැඟීම් බර ඉරියව් සාක්ෂි දැරීය

2010 හූස්මන් සම්මාන උළෙලේ දී හොඳම අධ්‍යක්ෂණයට හිමි වන එකම සම්මානය ප්‍රථම වරට ශ්‍රී ලංකාවට අත් කර දුන් මෙම චිත්‍රපටය තවත් අනාගත සිනමා දැවැන්තයෙක් ලොවට හඳුන්වා දුන් සාඩම්බරය විඳින්නට නුදුරු අනාගතයේ ම සමත් වෙනු ඇති

කතාව දිග ඇරෙන්නේ දිළිඳු ගම්මානයක මවත් සොහොයුරියත් සමගින් ජීවිතය ජීවත් කරවන්නට වෙහෙසෙන 'පොඩි එකා' නම් යොවුන් දරුවකු වටා ය ළමා විය සහ යොවුන් විය පිළිබඳ සියළු සිහින පොදි බිඳ වැටී සිරගත වන පොඩි එකා නිදහස් ලොවට පය තබා දහසකුත් එකක් හැල හැප්පිලිවලට මුහුණ දෙයි

ඔහුගේ ඉරණම වෙනස් වන්නේ ධනවත් එවකට හිත හොඳ ව්‍යාපාරිකයකු මුණගැසීමත් සමග සිදුවන සිදුවීම් මාලාවක් කැටි කොට ගෙන ය

පොඩි එකා ධනවතකු වන්නේ එක් ඇසිල්ලකිනි මිනී පෙට්ටි සාප්පුවක හිමිකරු වූ මේ ව්‍යාපාරිකයා වරෙක දානපතියෙකි අසරණයන්ට හිතවතෙකි දුප්පතුන්ට ත්‍යාගවන්තයෙකි එමෙන්ම අවස්ථානුකූලව මිනීමරුවෙකි

මිනිසා හොඳ හෝ නරක ලෙස ලේබල් ගසන්නට පුළුවන් යන්ත්‍රයක් නොවේ බොහෝ ක්‍රියාකාරකම් වලට අනුරූප වූ ක්‍රියාවන් ත්‍යාගියා මසුරෙකු කරයි අහිංසකයා මිනීමරුවකු කරයි බුද්ධිමතුන් අපරාධ සහායකයින් කරය.

එකෙකුගේ ඇවෑමෙන් මේ තැන ගන්නට තවත් එවැන්නකු නිරායාසයෙන් සමාජයට පිවිසෙයි ජීවිතය එකම රවුමේ කැරකෙන මේ වෘත්තාන්තයට 'බඹර වලල්ල' යයි නම් කිරීම කෙතරම් ප්‍රායෝගික දැයි තීරණය කරන්නට අධ්‍යක්ෂවරයා ප්‍රේක්ෂකයාට භාර කොට ඇත

අප බොහෝ දෙනෙකු ජීවිතයේ යම් දිනෙක ප්‍රායෝගිකව අත්විඳින යම් කිසි සත්‍ය හැඟීමක් මේ කතාව තුළ කොහේ හෝ ගැබ්ව ඇති බව මට සිතෙයි ආදරය වෛරයෙන් කෙළවර වෙයි අහිංසක දරුවා මොහොතක දී මිනීමරුවකු වෙයි ඉතාමත්ම ස්වභාවික ලිංගික ආශාවන් මිනිසුන් නොමිනිසුන් කරයි බුද්ධිමතුන් අහිංසක අපරාධකවරුවන් කරයි

තමාට එරෙහි වන අයෙකුට දඬුවම් දෙන්නට සෑම මිනිසකු තුළ ම ඇති වන ස්වභාවික පළි ගැනීමේ චේතනාව එකි-නෙකාගේ හැකියාව තරාතිරම මත ඕනෑම අහිංසකයකු හෝ දාමරිකයකු තුළින් මතු වන ආකාරය සෑම චරිතයක් හරහා ම දක්නට ලැබෙයි

මෙවැනි සමාජ සාරධර්ම ගැඹුරු ලෙස විමර්ශනය කරන 'බඹර වලල්ල' එක හුස්මට නැරඹිය හැකි සිනමා පටයක් ලෙස නම් කරන්නට මම පුසබට නොවෙමි නිතර චිත්‍රපට නරඹා හොඳ නරක විග්‍රහ කිරීමේ කලාව ප්‍රගුණ නොකොට චරිතවල සුවිශේෂී රංගනය ගැන කියන්නට මම නොදනිමි එහෙත් කිසිදු චරිතයක් මේ තුළ ජීවත් නොවුණා යයි කියන්නට බැරි තරම් මහේන්ද්‍ර නීටා දමිතා ශ්‍රියන්ත ජයලත් අතුල ඇතුළු නළු නිළි කැල මෙහි කොටස්කරුවන් යැයි මා සිත දැඩි ලෙස විශ්වාස කළ බව මට ඉඳුරාම දැනෙයි

ඔක්තෝම්බර් 21 දා රෝවිල් ද්විතීයික පාසැල් චිත්‍රාගාරයේ දී 2 30 ට සහ 6 30 ට ඔබටත් මේ සුන්දර මිනිසා අතුල ලියනගේ මුණගැසී චිත්‍රපටය රස විඳින්නට ලැබෙන භාග්‍යය මුළු මෙල්බර්න් වාසී ජනතාවගේ ම මහඟු වාසනාවකි

චින්තා කොස්සින්න

MIGRATE TO AUSTRALIA
MULTINATIONAL MIGRATION SERVICES &
AUSTRALIAN MIGRATION SERVICES
The First Registered Migration Agent for Sri Lanka
Listed in the registry of Migration Agents Registration Authority (MARA) in Australia

ONSHORE
- Graduate skilled visa
- Student visa renewal
- Change visa subclass
- Family sponsored visa
- Skills assessments
- Change course provider
- Partner visa
- MRT (Review application)

OFFSHORE
- Skilled visa
- Student visa
- Visit visa
- In house IELTS
- Business visa
- Spouse visa
- Parent visa
- Appeals

Special rates & terms available for international students
"EXPERIENCE THE DIFFERENCE"
Affordable fees & easy payment terms

Meet our qualified consultants with years of experience who can deliver the results
Senior Migration Consultants:
Hirosh Hemantha Gamage MARN 0320696 Peter Russell Loughton MARN 9789986
Tel: 03-94377384
4/45, Ancona Drive, Mill Park, Victoria 3082, Australia.
Consultation by Appointment only
Tel: 011 5 500 100
245, 3rd Floor, Dharmapala Mawatha, Colombo 07, Sri Lanka.
For More Details or Free Online Assesment Visit Our Website
www.multinational.com.au
E-mail : info@multinational.com.au